# ආත්මවාදී සංකල්පය නැතිකිරීම සඳහා දේශිත අලගද්දූපම සූත්‍රය

අලගද්දූපම සූත්‍ර දේශනාව බුදුරජාණන් වහන්සේ විසින් සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩවසන සමයෙහි ගන්ධබාධිපුත්ත (ගිජු ලිහිණියන් නසන කුලයෙහි උපන්) අරිට්ඨ නම් භික්ෂුවක් අරභයා දේශනා කරන ලද්දකි. මේ දේශනාව සිදු කිරීමට ප්‍රධාන හේතුව වූයේ අරිට්ඨ නම් භික්ෂුව බුදුරජුන් දේශනා කළ ''යම් අන්තරායකර ධර්ම කෙනෙක් (ස්වර්ග මෝක්ෂ දෙකට) අන්තරායකරයැයි යම්සේ වදාරණ ලද ද ඒ ධර්මයෝ සේවනය කරන්නාහට අන්තරාය පිණිස නොපවතින්නේ යැයි යන මේ කාරණය හොඳින් දනිමි''යනුවෙන් ප්‍රකාශ කළ විපරීත පාප දෘෂ්ටිය නිසාය. ඉන්පසු මේ කාරණය අනෙකුත් භික්ෂූන් වහන්සේලා ඇසූහ. ඔවුහු අරිට්ඨ භික්ෂුව කරා එළඹ මේ කාරණය ඔබ විසින් දරණ ලද්දේ දැයි යන්න විමසූහ. එවිට 'එය එසේය' යනුවෙන් අරිට්ඨ භික්ෂුව විසින් පිළිගෙන ඇත. එවිට භික්ෂූන් වහන්සේලා අරිට්ඨ භික්ෂුවට දොස් කියා එසේ නොකියන ලෙසත් බුදුරජුන්ට අභ්‍යාක්ඛ්‍යාන (අසත්‍ය දෙයින් දොස් නොකියන ලෙස) නොකරන්න යැයි කියා, බුදුරජුන් යම් අන්තරාකර ධර්මයක් දේශනා කරන ලද්දේ නම් එය අන්තරායකර ම වන්නේ යැයි කීහ. එහිදී තව දුරටත් මෙය විස්තර කිරීම් වශයෙන් පෙන්වා දෙන්නේ භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ අල්ප ආස්වාද සහිතය. දුක් සහගතය. ආදීනව බොහෝය. කාමයෝ ඇටසැකිල්ලකට, මාංශ පේශියකට, තණ හුලකට, ගිණි අඟුරු වලකට, සිහිනයකට, පිරුළුවකට, රුක් ඵලයකට, අසිපත හා මස් ලොඹුවකට, අඩයටි හුලකට, සර්ප හිසකට ආදි නොයෙක් දේවල්වලට උපමා කොට ඇති බව දක්වමින් කරුණු අවබෝධ කරදීමට උත්සහ ගත්හ. එහෙත් අරිට්ඨ භික්ෂුව විසින් ප්‍රකාශ කරනු ලබන්නේ මුලින් කී ආකාරයට ම ධර්මයෝ අන්තරායකර නොවන බවය. ඉන්පසු භික්ෂූන් වහන්සේලාට අරිට්ඨ භික්ෂුවට කරුණු අවබෝධ කර දෙන්නට නොහැකි වූ අවස්ථාවේ උන්වහන්සේලා සියලු දෙනා ම බුදුන් වහන්සේ කරා එළඹ මේ පුවත බුදුරජුන්ට සැල කර සිටියහ. ඉන්පසු බුදුරජුන් එක්තරා භික්ෂූන් වහන්සේ නමක් කැඳවා අරිට්ඨ වෙත ගොස් තමා සමීපයට පමුණුවාගෙන එන්න යැයි කීහ. ඒ භික්ෂූන් වහන්සේ අරිට්ඨ තෙරුන් වෙත ගොස් ඔහු සමඟ පැමිණ බුදුරජුන් හමුවිය. බුදුරජුන් ඉහත කී කාරණය විචාරණ ලදුව 'එය එසේම' යැයි අරිට්ඨ තෙරහු කීහ. ඉක්බිති බුදුරජුන් අරිට්ඨ තෙරුන්ට නොයෙක් ආකාරයෙන් දොස් නඟා තදින් අවවාද කොට අරිට්ඨ තෙරුන් ඇතුලු භික්ෂූන් වහන්සේලාට දේශනා කරනු ලබන්නේ මෙවැනි වැරදි ආකල්පයක් කෙනෙකු තුළ ගොඩ නැඟෙන්නේ සර්පයා වැරදි ලෙස අල්ලා ගන්නාක් මෙන් ධර්මය වැරදි ලෙස ග්‍රහණය කර ගැනීම නිසා බව පෙන්වා දෙමින් සියලු භික්ෂූන් වහන්සේලාට ධර්මය කියා දීමක් වශයෙන් අලගද්දූපමාව (සර්පයකු පිළිබඳ උපමාව) කේන්ද්‍රකොට මෙම සූත්‍රය දේශනා කරන ලදි.[1]

මජ්ඣිම නිකායේ ඕපම්ම වර්ගයට අයත් දෙවන සූත්‍රය වන අලගද්දූපම සූත්‍රය වූ කලී දීර්ඝ දේශනාවකි. මෙම සූත්‍ර දේශනාවට අනුව විග්‍රහ කෙරෙන අන්තරායකර ධර්මයෝ කොටස් පහක් යටතේ විස්තර කළ හැකිය. එනම්, කම්ම, කිලෙස, විපාක, උපවාද, ආණාවීතික්කම යනුවෙනි.[2] මෙහි ''කම්ම අන්තරායකර'' යනු පංච ආනන්තරිය පාපකර්ම හා ස්ත්‍රී දූෂක යන ඒවාය. මෙම කර්ම මග්ගන්තරාය වන අතර සග්ගන්තරාය නොවේ. මිථ්‍යා දෘෂ්ටිය හෙවත් වැරදි

දැක්ම ''ක්ලේශ අන්තරායික'' වේ. පණ්ඩක (නපුංසක) තිරශ්චීනගතික (තිරිසන්) උභතොභ්‍යඤ්ජනක (ස්ත්‍රී හා පුරුෂ) අයගේ ප්‍රතිසන්ධි වීම ''විපාක අන්තරායකර'' නම් වේ. ආර්යයන් වහන්සේලාට කරන්නා වූ අපවාදයන් ''උපවාද අන්තරායික'' වේ. එය ද ආර්යයන් කමා කරන තෙක් පමණි. ඉන් මතුවට නොවෙති. දැන දැන ඉක්මවන ලද සප්ත ආපත්තිස්කන්ධ ''ආඥා ව්‍යාතික්‍රම අන්තරායික'' නම් වේ. එය ද ඇවැත් වලින් නැගී සිටීම හා දේශනා කිරීම වන තෙක් පමණි.[3]

බුදුරජුන් දේශනා කරන අන්දමට පුද්ගලයාගේ සසර පැවැත්මට හේතුවන්නේ ඉහතින් සඳහන් කෙරුණු අන්තරායකර ධර්මයෝය. බුද්ධ වචනයේ පරම නිෂ්ඨාව වන්නේ සංසාරගත දුක නැතහොත් මිනිසාට උරුම වී ඇති අසාර වූ අතෘප්තිකර වූ ජාති, ජරා, ව්‍යාධි, මරණ, ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස ආදිය පිළිබඳ ව සැබෑ අවබෝධයක් ඇති කොට සසර දුකින් අත් මිදීම පිණිස වෑයම් කිරීම සඳහා සිත දියුණු කරලීමය. ඉහත කී දුක්ඛයෝ ඇති වීමට ප්‍රධාන වශයෙන් පුද්ගලයා තුළ ඇතිවන කාමාදී ආශාවන් හේතු වන බව පෙන්වා දියහැකිය. ඒවා අන්තරායකර ධර්ම වශයෙන් පෙන්වා දිය හැකිය. ඒ අනුව සූත්‍රාගත තොරතුවලට අනුව කාමයෝ (මඳ වූ රසවිඳීම් ඇති නිසා) ඇට සැකිල්ලකට, (බොහෝ දෙනෙකුට සාධාරණ නිසා) මාංශ පේශියකට, (වහා දිරාපත්වන නිසා) තණ හුලකට, (බොහෝ දැවීම් ඇති නිසා) ගිනි අඟුරු වලකට, (තාවකාලික පැවැත්මක් ඇති නිසා) සිහිනයකට, (සියලු අඟපසඟ බිඳෙන නිසා) රුක්ඵලයකට, (විනිවිද පෙනෙන නිසා) ආයුධ උලකට, (සැක හා බිය සහිත නිසා) සර්ප හිසකට ආදී නොයෙකුත් දෑ වලට උපමා කොට ඇත්තාහ.[4]

මෙකී කරුණු සැලකිල්ලට ගෙන අප විසින් බුද්ධ වචනය පිළිපැදිය යුත්තේ සංසාර දුක්ඛය නැති කොට පරම නිෂ්ඨාව වන නිවන සාක්‍ෂාත් කරලීම සඳහා වෑයම් කිරීමය. ඒ සඳහා අනිකුත් ආගමික දර්ශනයන්ට දොස් නැගීම, එවැනි ආගමිකයන් පහතට හෙළා කටයුතු කිරීම බුදුදහම නොපිළිගනියි. පසුකාලීන ව ඇති වූ අශෝක ශිලා ලේඛනයන්හි දී පවා මේ කාරණය සිදු නොකළ යුත්තක් ලෙස පෙන්වා දී තිබේ.[5] යම් කෙනෙක් එසේ සිදු කරන්නේ නම් එය ධර්මය වැරදි ලෙස ගැනීමකි. අලගද්දූපම සූත්‍රයට අනුව සර්පයෙකු වල්ගයෙන් අල්වා ගැනීමක් වැනිය. යම්සේ සර්පයන්ගෙන් ප්‍රයෝජන ඇත්තා වූ, සර්පයන් සොයන්නා වූ පුද්ගලයෙක් මහත් සර්පයෙකු දකින්නේය. ඔහු සර්පයා දැක ශරීරයෙන් හෝ නඟුටෙන් අල්වා ගන්නේය. මෙය වැරදි අල්වා ගැනීමකි. සර්පයා වැරදි ආකාරයෙන් අල්වා ගැනීමෙන් සිදුවන්නේ ඌ ආපසු හැරී එසේ අල්ලා ගත් පුද්ගලයාට දෂ්ට කිරීමය. ඒ හේතුවෙන් හෙතෙම මරණයට හෝ මරණය වැනි සමාන දුකකට හෝ පත්වන බව පෙන්වා දී තිබේ. සර්පයා අල්වා ගත යුත්තේ එළු කුරයක හැඩය ඇති දණ්ඩක් උපයෝගී කරගෙන ඉතා පරිස්සමෙනි. එයින් සර්පයාට දෂ්ට කිරීමට ඇති ඉඩ ඇහිරී යන්නේය.[6]

අලගද්දූපම සූත්‍රය බුද්ධ වචනයෙහි වටිනාකම අරමුණ මෙන් ම ස්වභාවය ද පසක් කරනු වස් ඉදිරිපත් කරනු ලබන තවත් උපමාවක් වන්නේ කුල්ලූපමාවයි. අලගද්දූපම සූත්‍රයේ දී ද කුල්ලූපමාවෙන් පෙන්වා දී ඇත්තේ ද ධර්මය පුද්ගල ජීවිතයට කෙතරම් දුරට බලපාන්නේ ද යන්නය. මෙහි දී ධර්මය උපමා කොට ඇත්තේ පහුරකටය. පහුරක අවශ්‍යතාවය වන්නේ ගඟකින් එතෙර වීමටය. එතෙර වූ පසු පහුර තමාට එගොඩට යාමට උදව් වූයේ යැයි සිතා එය කරමත

තබාගෙන යෑම අනවශ්‍යය. ඒ අනුව ම ධර්මයෙහි අවශ්‍යතාවය වන්නේ සසර දුකින් එතෙර වීමටය. නිවන් දුටු පසු මේ (සමථවිපස්සනාදී) ධර්මයෝ වැඩීම තුළින් ප්‍රතිඵලයක් නොවන්නේය. එය අනවශ්‍යය. අධර්මයන් ගැන කියනු ම කවරේද?[7]

ඉහතින් සඳහන් කළ අලගද්දූපම සූත්‍රයෙහි සඳහන් වන උපමා දෙකින් අනතුරුව බුදුරජුන් විසින් දේශනා කරන ලද්දේ ආත්ම දෘෂ්ටිය, එහි ආදීනව හා එය නිස්සරණය කළයුතු ආකාරය පිළිබඳව ය. මෙහි පෙන්වා දෙන අන්දමට අශ්‍රැතවත් පෘථග්ජනයා හෙවත් බුදුබණ නෑසූ ආර්යයන් නොදක්නා ආර්ය ධර්මයෙහි අදක්‍ෂ ආර්ය ධර්මයෙහි නොහික්මුණු සත්පුරුෂ ධර්මය නොදන්නා වූ සත්පුරුෂ ධර්මයෙහි අදක්‍ෂ සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුණු තැනැත්තා තුළ ආත්ම දෘෂ්ටීහු 6 ක් උපදිනා බව කියවේ. රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යන ස්ඛන්ධ හතර ද දිට්ඨි සුත, මුත, විඤ්ඤාත, වශයෙන් දක්වන ලද දොළොස් ආයතන මෙන් ම මේ ලෝකය හා පරලොව නිත්‍ය, ධ්‍රැව, ශාස්වත, අවිපරිනාම ස්වභාව ඇත්තේ යැයි සලකා කටයුතු කිරීම යන කරුණු හය උපදියි. ඒ පිළිබඳ ව තණ්හා, මාන, දිට්ඨි වශයෙන් වෙන වෙන ම ගෙන 'මෙය මාගේය' (එතං මම) 'මේ මම වෙමි' (එසොහමස්මි) 'මේ මගේ ආත්මය වේ' (එසො මෙ අත්තා) යනුවෙන් සැලකීම එම පුද්ගලයාගේ ස්වභාවයයි.[8] මෙවැනි අදහස් ඇතිවීම ආත්මවාදය ලෙසින් හඳුන්වනු ලැබේ. බුදුසමය මෙයින් බැහැර ව අනාත්ම සංකල්පය ඉදිරිපත් කරනු ලබයි.

බුදුරජුන් විසින් ලෝකයේ සැබෑ ස්වරූපය පෙන්වා දීමක් වශයෙන් දේශනා කරන්නට යෙදුණ හේතුඵලවාදය හෙවත් පටිච්චසමුප්පාද දේශනාව තුළින් පුද්ගලයාගේ මරණින් පසු නිත්‍ය ආත්මයක් ඇතැයි යන මතය ඉදිරිපත් කළ ශාස්වතවාදී දෘෂ්ටියත්, මරණින් සියල්ල කෙළවර වේය යන මතය දැරූ උච්ඡේද දෘෂ්ටියත් බැහැර කරනු ලබයි. බුදුරජුන් පහළ වීමට පෙර යුගයේ පටන් ම මෙම දෘෂ්ටිවාද පැවතුණි. එවැනි දෘෂ්ටිවාද 62 ක් පිළිබඳ ව කරුණු දී. නි. බ්‍රහ්මජාල සූත්‍රයේ පෙන්වා දී තිබේ.[9] මේ සියලු ම දෘෂ්ටිවාද බුදුරජුන් කොටස් දෙකක් යටතේ විග්‍රහ කර ඇත. එනම් ශාස්වතවාද හා අශාස්වතවාද (උච්ඡේදවාද) යන්නයි. මෙය පදනම් කරගෙනම බුදුරජුන් සම්බෝධිය ලැබීම සඳහා ද අනුගමනය කරන ලද්දේ මධ්‍යම ප්‍රතිපදාවයි. එහි දී ශරීරයට දැඩි දුක් ගෙන දෙන්නා වූ ශාස්වත දෘෂ්ටියක් වූ අත්තකිලමථානුයොගයත්, දැඩි සැප ගෙන දෙන්නා වූ අශාස්වත දෘෂ්ටියක් වූ කාමසුඛල්ලිකානුයෝගයත් අත්හළ බවත් ඉන්පසු මධ්‍යම ප්‍රතිපදාව හෙවත් ආර්ය අෂ්ටාංගික මාර්ගය වැඩූ බවත් කියවේ.[10]

ඒ අනුව මධ්‍යම ප්‍රතිපදාව යනු සියලු අන්තවාදී දෘෂ්ටීන් බැහැර කොට මධ්‍යස්ථ බව රකින නිදහස් චින්තනයක් ලෙස පෙන්වා දිය හැකිය. එහෙත් බ්‍රාහ්මණ හා උපනිෂද් යුගවලදී ආත්මවාදය බෙහෙවින් සංවර්ධනය වූ නිසා නොයෙක් නයින් විග්‍රහයට ලක් වූ දාර්ශනික ප්‍රස්තුතයක් විය. ආත්මයක් නොපිළිගන්නා තැන ආගමක්, ධර්මයක්, දර්ශනයක් බිහි නොවන බව ඔවුහු කල්පනා කළහ. ඊට අමතර ව මරණින් පසු මතු පැවැත්මක් නොමැති බව ද ඔවුහු පෙන්වා දුන්හ. ඒ නිසා ජීවත් ව සිටින කාලයේ ණය වී හෝ ගිතෙල් කා සතුටින්, විනෝදයෙන් කාලය ගත කළයුතු බව ප්‍රකාශ කළහ. ඊට හේතුව නම් මේ අළු කරන ලද ශරීරයේ නැවත පැවැත්මක් ඇති නොවන බව සර්ව දර්ශන සංග්‍රහයේ දැක්වේ.[11] බුදුරජුන් අනාත්ම ධර්මය ඉදිරිපත් කරන්නේ එබඳු පසුබිමක් තුළය. එම නිසාම බුදුරජුන් ද උච්ඡේදවාදියෙක් යැයි ඇතැම් සමකාලීනයන්ට පෙනී ගිය බව පෙළ දහමින් හෙළිවෙයි. ''ශ්‍රමණ භවත් ගෞතමයන් සියලු කර්ම අකිරිය යැයි

පණවමින් ලෝකයට උච්ඡේදවාදයක් ගැන කියන්නේය'' [12] නමුත් මෙහි අනාත්ම යැයි කී පමණින් එය ආත්ම වේ යැයි ගම්‍ය නොවේ. එය මධ්‍යම ප්‍රතිපදාවමය. ඒ බව සංයුත්ත නිකායේ අත්ථත්ත සූත්‍රයෙන් පැහැදිලි වේ. එහි සඳහන් වන අන්දමට දිනක් වච්ඡගොත්ත නම් පරිබ්‍රාජකයා බුදුරජුන් වෙත පැමිණ ආත්මයක් ඇත්දැයි විචාරයි. එවිට බුදුන් නිහඬව සිටියි. නැවත පරිබ්‍රාජකයා එසේනම් ආත්මයක් නැතිදැයි විමසා සිටියි. බුදුහිමියෝ එහිදී ද නිහඬව සිටියහ. වච්ඡගොත්ත පිටත් ව ගිය පසු ආනන්ද හිමියන් විමසන්නේ එසේ පිළිතුරු නොදී සිටියේ කුමක් නිසාද? යනුවෙනි. එවිට බුදුරජුන් ප්‍රකාශ කරන්නේ ආත්මයක් තිබේදැයි යන ප්‍රශ්නයට තිබේ යැයි කීවානම් ශාස්වතවාදයට වැටෙන බවය. ආත්මයක් නැතැයි කීවේනම් උච්ඡේදවාදයට වැටෙන බවය. [13] ආාත්මවාදය පිළිබඳ ව තවත් ප්‍රකාශයක් සංයුත්ත නිකායේ කච්චානගොත්ත සූත්‍රයේ සඳහන් වේ. එහිදී කච්චානගොත්ත විමසන්නේ ''ඔබ වහන්සේ සම්මාදිට්ඨී සම්මාදිට්ඨී යනුවෙන් දේශනා කරයි. මේ සම්මා දිට්ඨීය කුමක්ද?'' එවිට බුදුරජුන් දේශනා කරන්නේ ''මේ ලෝකයේ සිටින පුද්ගලයන් අස්තිත්වය හා නස්තිත්වය යන දෙකොටස ගෙන වාදවිවාද කරමින් සිටින බවය.'' එහෙත් ඒ නිෂ්ඵල දෙයකි. තමන් වහන්සේ මේ දෙක ම මනාකොට අවබෝධ කරගෙන ''සියල්ල ඇත නැත යන අන්ත දෙකටම නොවැටී මධ්‍යස්තව දහම් දෙසන බවය. එම ධර්මය නම් පටිච්චසමුප්පාදයයි. එයම සම්මාදිට්ඨීය වන්නේය.''[14]

මේ කරුණු සැලකිල්ලට ගෙන බැලීමේදී පැහැදිලි වන්නේ ආත්ම දෘෂ්ටියෙන් බැහැර වූ අනාත්ම සංකල්පය ප්‍රකට කෙරෙන ලෝකයේ ඇති විවිධ ආගමික දර්ශනයන් අතරින් එකම ධර්මය වන්නේ බුදුදහම වන බවය. ස්ථවිරවාදීන් මෙන් ම මහායානිකයන් විසින් ද අවිවාදාත්මකව පිළිගන්නා වූ එය බුදු සමයෙහි සුවිශේෂි අනන්‍යතාවයකි.[15] පටිසම්භිදාමග්ගයේ විපල්ලාස කථාවට අනුව සත්වයා සත්‍ය වූ දෙය සත්‍ය වශයෙන් නොදැනීම හෙවත් අවිද්‍යාව නිසා විපරීත වූ අදහස් මෙන් ම චින්තන ඇති කරගනී. ඔහු වෙනස්වන දේ වෙනස් නොවේ යැයි ද, දුක් සහිත දේ සැප ලෙස ද, අනාත්ම දේ ආත්ම යැයි ද, අසුභ දේ සුභ යැයි ද සිතයි. මෙසේ වෙනස් වන්නා වූ දුක් සහිත වූ දෙය සුඛ සහගත ලෙස අවබෝධ කොටගෙන 'මම' ය 'මාගේ' ය යනුවෙන් සලකයි. මෙසේ සිතීම බුදු දහමට අනුව 'ආත්ම' යනුවෙන් හඳුන්වයි.[16] මෙම ආත්මවාදී සංකල්පය බුදුසමය හැර අනෙකුත් සියලු ම භාරතීය සමය සමයාන්තරයන්හි දක්නට ලැබෙන්නකි. ''මම සිටියෙමි. පෙර පැවැත්මක් මට තිබුණි. වර්තමානයේ ද එසේමය. මම මතුවට ද සිටිමි. මට මතු පැවැත්මක් ඇත. මම හෙවත් ආත්මය ස්ථිරය. සදාකාලිකය'' යැයි ගැන්ම ආත්මවාදයේ පදනමයි. ඒ අනුව බුදු දහම නොයෙක් අවස්ථාවලදී මෙන්ම අලගද්දූපම සූත්‍රයෙන් ද පෙන්වා දීමට උත්සහ ගන්නේ අනාත්මය මගින් එහි ඇති විපරීත බව ප්‍රකාශ කිරීමටය. එහිදී ප්‍රධාන වශයෙන් ආත්ම සංකල්පය බැහැර කිරීම සඳහා දේශනා කෙරී ඇති ධර්ම විග්‍රහය වන්නේ ත්‍රිලක්ෂණයයි.

ඉහතින් සඳහන් වූ විපරීත අදහස්වලින් සත්වයා මුදවාගෙන අනිත්‍ය දුක්ඛ අනාත්ම යන ත්‍රිලක්ෂණාවබෝධය තුළින් යථාර්ථය පෙන්වා දීම බුදු දහම අගය කරයි. බුදුවරු අනිත්‍ය දේ අනිත්‍ය යැයි ද දුක් සහගත දේ දුක් යැයි ද අනාත්ම ධර්මයන් අනාත්ම ලෙසින් ද වටහා ගැනීමට මග පෙන්වති. එම මාර්ගය වටහා ගැනීම ම විමුක්තිය ලබා ගැනීමකැයි ද පෙන්වා දෙති.[17] මෙසේ පෙන්වා දෙන ත්‍රිලක්ෂණය පමණක් නොව පටිච්චසමුප්පාදය, චතුරාර්ය සත්‍යය යන ධර්ම කරුණු

විශ්ව සාධාරණ වූවකි. එය බුදු කෙනෙක් ලොව පහළ වුවත් නොවූවත් පවතින්නා වූ පොදු ධර්මතාවයකි.[18] එහෙත් සමය සමයාන්තරිකයන් අනාත්ම පිළිබඳ ව වැරදි විවරණයක් දීමට උත්සහ ගත් නිසා බුදුරජුන් නියම විවරණය සපයා ඇති බව පැහැදිලිය. මෙම කරුණ තහවුරු කිරීම පිණිස බුදුරජුන් නොයෙක් සූත්‍රයන්හි අනාත්ම සංකල්පය ප්‍රකට කෙරෙන දේශනා ඉදිරිපත් කර ඇති අයුරු දැක ගත හැකිය. ම. නි. චූල්ල සච්චක සූත්‍රයේදී අනාත්ම සංකල්පය ඉදිරිපත් කෙරෙන ත්‍රිලක්ෂණය පැහැදිලි කොට ඇත්තේ ධර්ම සංකල්පයට සමගාමීවය. එනම් ලෝකය හා සත්වයා පිළිබඳ මූල සාධක හෙවත් නාමරූප ධර්ම එකිනෙක ගෙන ත්‍රිලක්ෂණය දේශනා කර ඇත. විටෙක ස්ඛන්ධ විභාගයට අනුව ''රූපය අනිත්‍යය. වෙදනාව අනිත්‍යය. සංඥාව අනිත්‍යය. සංස්කාරය අනිත්‍යය. විඤ්ඤානය අනිත්‍යය. යමක් අනිත්‍ය නම් එය දුකය. යමක් දුක් සහගත නම් එය අනාත්මය'' යනුවෙන් දක්වා තිබේ.[19]

එසේම සංයුත්ත නිකායේ නඛසිකා සූත්‍රයේ සඳහන් වන අන්දමට වරක් බුදුරජාණන් වහන්සේ නිය අගින් පස් බිඳක් ගෙන භික්ෂූන් අමතා ''මහණෙනි වැඩිපුර පස් ඇත්තේ මගේ නියගෙහිද? මහපොළොවෙහි දැයි'' ප්‍රශ්න කළහ. ස්වාමීනි නියගෙහි ඇත්තේ පස් ස්වල්පයකි. මහ පොළොවෙහි පස් බොහෝ යැයි පිළිතුරු දුන්හ. එවිට බුදුරජුන් පවසන්නේ මේ නියගෙහි ඇති පස් බිඳ තරම්වත් සත්වයෝ මිනිසුන් ලෙස නූපදින බවය. එමනිසා වෙනස් නොවන සුළු සදාකාලික කිසිවක් මම නොපනවමි. මෙළොව එතරම්වත් නිත්‍ය යමක් ඇත්නම් දුක නැති කිරීම පිණිස බඹසර වසන්න යැයි මම තොපට නොකියමි. මම බඹසර වසන්න යැයි වදාරන්නේ සියල්ල අනිත්‍ය නිසාය'' යනුවෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කළහ.[20] මෙයින් පෙනෙන්නේ ලෝකයේ පවතින සියල්ලක් ම මොහොතින් මොහොත වෙනස් වන බවය. පුද්ගලයාගේ පැවැත්ම ද එසේය.

බොහෝ අවස්ථාවල ප්‍රශ්නෝත්තර ක්‍රමයකට ස්ඛන්ධ විභාගය අනුව ත්‍රිලක්ෂණය දේශනා කර තිබේ. ''මහණෙනි රූපය නිත්‍ය ද? අනිත්‍ය ද? අනිත්‍යයයි ස්වාමිනි, යමක් අනිත්‍යය නම් එය දුක ද? සැප ද? ස්වාමිනි දුක් සහගතය. යමක් දුක නම් වෙනස් වන සුළු නම් මේ 'මම' ය 'මාගේ' ය යන්වෙන් කිසිවක් ආත්ම වශයෙන් ගත හැකිද? ස්වාමිනි එසේ නොකිව හැකිය.''[21] යන සාකච්ඡාව හමුවේ. ස්ඛන්ධ පඤ්චකය ම අනිත්‍ය දුක්ඛ අනාත්ම යැයි පටිපුච්ඡා ක්‍රමයකට ශ්‍රාවකයන්ගෙන් ම ප්‍රකාශ කරවීම මෙවැනි අවස්ථාවල දී බුදුරජුන් අනුගමනය කර ඇත. මෙහිදී විශේෂයෙන් ම බුදුරජුන් අපේක්ෂා කර ඇත්තේ අනාත්ම යන්න තහවුරු කිරීමය. අනිත්‍ය, දුක්ඛ යන දෙක සමකාලීනයන් ද යම් පමණකට පිළිගත් නමුත් අනත්ත යන්න කිසිවෙක් පිළිගෙන නොතිබුණි. මීට අමතරව පඤ්චවග්ගිය සූත්‍රයේ දී ස්ඛන්ධ පඤ්චකය වෙන් වෙන් ව ගෙනහැර පාමින් සෑම ස්ඛන්ධයක් ම අනාත්ම යැයි අවධාරණය කොට තිබේ.[22] තවදුරටත් එය විස්තර කරමින් දේශනා කර ඇත්තේ ''මහණෙනි රූපය ආත්මය නොවේ. රූපය ආත්මය වේනම් එය ආබාධවලට ලක් නොවිය යුතුය.''[23] යනුවෙනි.

සංයුත්ත නිකායෙහි අස්සුතවන්තු සූත්‍රයේ දී ද ආත්ම සංකල්පය බැහැර කිරීම සඳහා ධර්මය දේශනා කෙරී ඇත. ''මහණෙනි පුහුදුන් පුද්ගලයා සතර මහා භූතයන්ගෙන් හටගත් මේ ශරීරය ආත්ම වශයෙන් සලකයි. එය වරදකි. සිත ආත්ම වශයෙන් ගැන්ම ඊටත් වඩා වරදකි.''[24] මෙයින් පැහැදිලි වන්නේ සත්වයාගේ හටගැන්ම හා පැවැත්ම විග්‍රහ කෙරී ඇත්තේ 'පඨවි'

(තදගතිය) 'ආපෝ' (වැගිරෙන ස්වභාවය) 'තේජෝ' (සීත හා උණුසුම් බව) 'වායෝ' (වාතය) යන සතර මහා භූතයන් පදනම් කරගෙනය. එසේ ඇතිවන මේ පඤ්චස්කන්ධය සහිත පුද්ගලයා තුළ 'මම' ය 'මාගේ' ය යනුවෙන් ගතහැකි කිසිවක් නොමැත. එමනිසා ආත්මවාදී සංකල්ප පිළිබඳ ව සිතීම පවා සිදු නොකළ යුත්තක් ලෙස පෙන්වා දෙයි.

මේ නයින් බලන කල පුද්ගලයා මේ ලෝක වශයෙන් බැඳ තබනු ලබන්නේ පඤ්චස්කන්ධය පිළිබඳ ව උපාදානයක් ඇති කර ගැනීම නිසාය. එසේ නොවීමට නම් පුද්ගලයා විසින් අනුගමනය කළ යුත්තේ කුමක්ද? යන්නට ද අලගද්දූපම සූත්‍රය කරුණු දක්වයි. එනම් ඉහතින් සඳහන් කරන්නට යෙදුන ස්කන්ධාදී ධර්මයන් පිළිබඳ ව ඇතිකරගන්නා වූ ආත්ම දෘෂ්ටිය පිළිබඳ ව පවතින්නා වූ තෘෂ්ණාව නැතිකිරීමය. එහිදී මෙය මගේ නොවේ (නෙතං මම) මේ මම නොවෙමි (නෙසොහමස්මි) මේ මගේ ආත්මය නොවේ (නෙසො මෙ අත්තා) යනුවෙන් කල්පනා කළ යුතුය. එවිට මමත්වය මුල් කොට ගත් කිසිවක් නැතැයි අනාත්ම වශයෙන් සලකන ඔහු තුළ ආත්ම දෘෂ්ටියක් ඇති නොවේ. මෙසේ නුවණින් දැකීම තුළින් රූපාදීන් කෙරෙහි ඇතිවන්නා වූ තැති ගැන්ම ද නැති වී යයි.

ආත්ම දෘෂ්ටිය පිළිබඳ ව දෙසූ දහම අවසානයේ තවදුරටත් භික්ෂූන්ගේ ගැටලු නිරාකරණය කළ අයුරු අලගද්දූපම සූත්‍රයේ පෙන්වා දෙයි. එහිදී එක් භික්ෂූන් වහන්සේ නමක් විචාරන්නේ බාහිර දේවල් නැති කල්හි තැති ගැන්මක් ඇති වන්නේද? යන්නයි. එවිට බුදුරජුන් දේශනා කරන්නේ ධන, ධාන්‍යාදී බාහිර වූ දේ නැතැයි සැලකීමෙන් යමෙකුට තැති ගැන්මක් ඇති වන බව ද, තව කෙනෙකුට එසේ නොවන බව ද පෙන්වා දෙයි. එසේම ඇතැමෙකුට තමා පිළිබඳ ව ආධ්‍යාත්මික වූ දේ නැති කල්හි තැති ගැන්මක් වන බව ද, ඇතැමෙකුට එසේ නොවන බව ද පෙන්වා දෙයි. ලෝකය ද, ආත්මය ද, නිත්‍ය ශාස්වත යැයි ඇතැමෙකුට හැඟේ. සියලු දෘෂ්ටි, දෘෂ්ටි හේතු, දෘෂ්ටි පිහිටන තැන්, දෘෂ්ටි නැගී සිටීම්, දෘෂ්ටීන්ට බැසගැනීම් ආදිය වන විට තැති ගැන්මකුත් තැති නොගැන්මකුත් ඇති වන බව පෙන්වා දෙයි. තැති ගන්නා විට පුද්ගලයා තුළ ශෝකය උපදියි. වැළපෙයි. ළය අත්ගසා හඬයි. මුලාවට පැමිණෙයි. මෙසේ තමා පිළිබඳ ව වූවක් නැතැයි සිතමින් තැතිගැනීමට පත්වෙයි. මේ පුහුදුන් පුද්ගලයාගේ ගති ස්වභාවයයි. එසේ කල්පනා නොකරන පුද්ගලයාට තැතිගැන්මක් ශෝක කිරීමක් ආදිය ඇති නොවෙයි. යනුවෙන් දේශනා කර ඇත.[25]

මෙසේ පඤ්චස්කන්ධය පිළිබඳ ව පවතින්නා වූ ආත්ම දෘෂ්ටිය වැරදි සහගත ලෙස දැකීම හා ත්‍රිලක්ෂණාවබෝධය මනාව දැනගත් පසු ඒ පුද්ගලයා එනම් රහතන් වහන්සේ කරුණු පහකින් සමන්විත වන බව පෙන්වයි. සසරට මුල් වූ අවිද්‍යාදී මුල් උදුරා දැමූ බැවින්, ඔසවා තබන බැවින්, ප්‍රහීණ කරන ලද බැවින්, මුදුන සිඳින ලද තල් රුකක් මෙන් කරන ලද බැවින් එයින් මතු ඉපදීමක් නොවන නිසා 'උක්ඛිත්තපලිඝ' නම් වේ. දිය අගලක් සේ ගලා යන දුක් සහිත වූ පුනර්භවය දෙන්නා වූ ජාති සංහාරය ප්‍රහීණ කළ නිසා 'සංකිණ්ණපරිඛ' නම් වේ. සසරට මුල් වූ තෘෂ්ණාදි මුල් උදුරා දැමූ බැවින්, සිඳින ලද බැවින් 'අබ්බූළ්හසික' නම් වේ. සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස, කාමරාග හා පටිඝ යන පඤ්ච ඕරම්භාගිය සංයෝජන බිඳ දැමූ බැවින් 'නිරග්ගළ' නම් වේ. ස්කන්ධ බර, කෙලෙස් බර, අභිසංස්කාර බර බහා තැබූ බැවින් 'පන්නාභාර' නම් වේ.[26] එසේම රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යන පඤ්චස්කන්ධය

කෙරෙහි ඇති කරගන්නා වූ ''මම වෙමි'' ආදි වශයෙන් වන්නා වූ මානය බිඳ හෙලූ නිසා 'මානද්වජ' යනු ද මීට නමකි.[27]

මේ ආකාරයට තමන්ට ඇති වන්නා වූ කෙලෙස් ධර්මයන් ක්ෂය කොට උතුම් වූ නිරෝධයට පැමිණ වාසය කරන්නා වූ රහතන් වහන්සේ පිළිබඳ ව කරුණු අලගද්දූපම සූත්‍රාවසානයේ දක්වා තිබේ. අට්ඨකථාව මේ කරුණ උපමාවක ස්වරූපයෙන් වර්ණනා කර ඇත. චෝර නගරය හා ඛේම නගරය යනුවෙන් නගර දෙකක් තිබේ. එකළ මහා යෝධයෙකුට මෙබඳු සිතක් පහළ වෙයි. මේ චෝර නගරය තිබෙනතාක් ඛේම නගරය භයින් නොමිදෙයි. එම නිසා සන්නාහ සන්නද්ධ වී චෝර නගරයට පැමිණ ඇතුලු නුවර පිහිටි එක්ටැම් කුළුණ විනාශ කොට ජයපැන් බියයුතු බවය. මෙහි සත්කාය චෝර නගරය මෙනි. නිර්වාණය ක්ෂේම නගරය මෙනි. යම්තාක් සත්කාය පවතී ද ඒතාක් දෙතිස් කම් කටොලු, අට අනූ රෝග, පස්විසි මහා භය, ආදියෙන් මිදීමක් නැත. ඒ අනුව සීල නැමැති සන්නාහය ගෙන ප්‍රඥා නැමති කඩුවෙන් තෘෂ්ණාව නැමති එක්ටැම් කුළුණ ගලවා දොරපළුව හා නුවර කවුළුව මෙන් වූ පඤ්ච ඕරම්භාගිය සංයෝජන නැමති අගුළු ගලවා අවිද්‍යාව නැමති කැණිමඩල ඔසවා පවුර බිඳිමින් දිය අගල මෙන් වූ කර්මාභිසංස්කාරයන් බිඳ ජාති සංසාර නැමති දිය අගල විසුරුවා නගරාලංකාරය සඳහා එස වූ කොඩි මෙන් වූ මාන නැමති ධජ පතාක ගලවා සක්කාදිට්ඨි නැමති නගරය දවා කෙලෙස් රහිත වූ නිවන් පුරයෙහි ඵල සමවත්ව සුව විඳිමින් කල් යවන්නේය.[28] මේ රහතන් වහන්සේ කෙලෙස් සිඳලන ආකාරය උපමාවකින් ගෙනහැර දැක්වීමකි.

මෙබඳු ඉගැන්වීම් ඇති බුදුරජාණන් වහන්සේ ''සත්ත්ව විනාශය පණවන්නේය. සත්වයාගේ හට නොගැන්ම පණවන්නේය. උච්ඡේදවාදයෙන් කරුණු කියන්නේය''[29] යැයි ඇතැම් මහණ බමුණෙක් අසත්‍යයෙන් චෝදනා කරන බව අලගද්දූපම සූත්‍රයෙහි සඳහන් වෙයි. එහෙත් තමන් වහන්සේ පෙර බෝමැඩදී ප්‍රකාශකළ යම් කාරණයක් වේනම් එම කරුණ ම දැනුත් දක්වන බව සූත්‍රාවසානයේ දැක්වේ. එනම් මේ ලෝකය දුක්ඛ, දුක්ඛ සමුදය, දුක්ඛ නිරොධ, දුක්ඛ නිරොධ ගාමිනි පටිපදා වශයෙන් සිව්සස් දහම පදනම් කරගෙන පවතින බවය. එමනිසා එම මහණ බමුණන් කියන්නා වූ දෙය අසා තමන් වහන්සේ තුළ කිසිම ආකාරයක ද්වේෂයක්, වෛරයක් නැත්තා සේ ම තොපට ද යම් කෙනෙක් මෙසේ දොස් පරොස් කියානම් ඒ තුළ වෛරයක් ඇති නොකොට ඉවසීම ප්‍රගුණ කළ යුතු බව භික්ෂූන්ට දන්වයි. එය හුදෙක් තමාගේ මෙන් ම අන්‍යයන්ගේ ද බොහෝ කාලයක් හිත සුව පිණිස පවතින්නක් යැයි පෙන්වා දෙයි.[30]

සූත්‍රාවසානයේදීත් බුදුරජාණන් වහනසේ නැවතත් අවධාරණය කර ඇත්තේ තමන්ගේ නොවන්නා වූ යම් දෙයක් වන්නේ නම් ඒ සියල්ල අත් හළ යුතු බවය. එනම් රූප වේදානදී පඤ්චස්ඛන්ධය ද යම් දවසක අත්හළ යුතු බවය. ඒ තුළින් පුද්ගලයාට දීර්ඝ කාලයක් හිත පිණිස සුව පිණිස කරුණු යෙදෙන බව දන්වයි.

මේ ආකාරයෙන් තමා විසින් මනාකොට දේශනා කරන ලද යම් ධර්මයක් වේනම් එය පදනම් කරගෙන විමුක්තිගාමී පුද්ගලයාට ඇතැයි කිවහැකි සසර වටෙක් නොමැත. ඕරම්භාගිය සංයෝජන ප්‍රහීණ කළ යම් ශ්‍රාවකයෙක් වේ නම් ඒ තැනැත්තා ඔපපාතිකව ශුද්ධාවාස බ්‍රහ්ම ලෝකවල උත්පත්තිය ලබති. ආපසු මෙළොවට නොපැමිණෙත් සක්කායදිට්ඨි ආදි තුන්

සංයෝජනයන් ප්‍රහීණ කළ ශ්‍රාවකයෝ සකදාගාමි ඵලයෙහි පිහිටත්. එක් වරක් පමණක් මෙලොවට පැමිණ දුකින් මිදී නිවන් දකිත්. අවසානයෙහි උන් වහන්සේගේ රහත් බව නියතය.

මේ ආකාරයට අලගද්දූපම සූත්‍ර දේශනාව තුළින් භික්ෂූන් වහන්සේලාට දහම් දෙසා ඇති බුදුරජුන් එහිදී මේ සසර බැඳ තබන ආත්ම දෘෂ්ටිය අත්හළ යුතු බව පෙන්වා දෙයි. යම් කෙනෙක් ගන්ධබාධිපුත්ත තෙරුන් සේ වැරදි ආකාරයෙන් ආත්ම දෘෂ්ටිය තුළ බැසගෙන තමන් වහන්සේ දේශනා කරන ලද ධර්මය විග්‍රහයට ලක් කරන්නේ නම් හෝ අවබෝධ කරගන්නේ නම් එය සර්පයා වැරදි ආකාරයට අල්ලා ගැනීමක් හා සමාන ව බව පෙන්වා දෙයි. එයින් පුද්ගලයාට සිදුවන්නේ සර්පයා දෂ්ට කිරීමෙන් සිදුවන හානිය හා සමාන දුකකට පත්වීමටය.

ආන්තික සටහන්

---

[1] ම. නි. ඔපම්ම වග්ගය, අලගද්දූපමසුත්තං, බු. ජ. මු. නැදිමාල, 2005, පි. 325-354.

[2] අන්තරායිකා - තෙ කම්මකිලෙසවිපාක උපවාද අණාවීතික්කමවසෙන පඤ්චවිධා,

පපඤ්චසූදනී නාම මජ්ඣිමනිකායට්ඨකථා, හේ. වි. මු. 1948, පි. 85.

[3] තත්ථ පඤ්චානන්තරියධම්මා කම්මන්තරායිකා නාම, තථා භික්ඛුනීදූසකම්මං. තං පන මොක්ඛස්සෙව අන්තරායං නරොති, න සග්ගස්ස. නියතමිච්ඡාදිට්ඨිධම්මා කිලෙසන්තරායිකා නාම. පණ්ඩක තිරච්ඡානගත උභතොබ්‍යඤ්ජනකානං පටිසන්ධිධම්මා විපාකන්තරායිකා නාම. අරියූපවාදධම්මා උපවාදන්තරායිකා නාම. තෙ පන යාව අරියෙ න ඛමාපෙන්ති, තාවදෙව, න තතො පරං. සඤ්චිච්ච වීතික්කන්තා සත්ත ආපත්තික්ඛන්ධා ආණාවීතික්ඛමන්තරායිකා නාම. තෙපි යාව භික්ඛුභාවං වා පටිජානාති, න වුට්ඨාති වා, න දෙසෙති වා, තාවදෙව, න තතො පරං.

-එම- පි. 85.

[4] අට්ඨිකංඛලූපමා කාමා වුත්තා භගවතා, මාංසපෙසූපමා කාමා වුත්තා භගවතා, තිණුක්කූපමා කාමා වුත්තා භගවතා, අංගාරකාසූපමා කාමා වුත්තා භගවතා, සුපිනූපමා කාමා වුත්තා භගවතා, රුක්ඛඵලූපමා කාමා වුත්තා භගවතා, අසිසූණූපමා කාමා වුත්තා භගවතා, සත්තිසූලූපමා කාමා වුත්තා භගවතා, සප්පසිරූපමා කාමා වුත්තා භගවතා, බහුදුක්ඛා බහුපායාසා ආදීනවො එත්ථ භියෙයා''ති

ම. නි. ඔපම්ම වග්ගය, අලගද්දූපමසුත්තං, බු. ජ. මු. නැදිමාල, 2005, පි. 326.

[5] තථා අථ පාශංඩ පූජා වා පලපාශංඩගලහා වා නො සියා,

අශෝක ශිලා ලේඛන, තුන්වන මුද්‍රණය, බෙල්ලන ඥානවිමල හිමි, සමයවර්ධන පොත්හල, මරදාන, පි. 44

[6] ම. නි. ඔපම්ම වග්ගය, අලගද්දූපමසුත්තං, බු. ජ. මු. නැදිමාල, 2005, පි. 334.

[7] කුල්ලූපමො මෙ ධම්මො දෙසිතො නිත්ථරණත්ථාය නො ගහණත්ථාය. කුල්ලූපමං වො භික්ඛවෙ ධම්මං දෙසිතං ආජානන්තෙහි ධම්මාපි වො පහාතබ්බා, පගෙව අධම්මා.

ම. නි. අලගද්දූපමසුත්තං, බු. ජ. මු. නැදිමාල, 2005, පි. 338.

[8] ම. නි. අලගද්දූපමසුත්තං, බු. ජ. මු. නැදිමාල, 2005, පි. 338.

[9] දී. නි. බ්‍රහ්මජාලසුත්තං, බු. ජ. මු. නැදිමාල, 2004, පි. 20.

[10] ද්වේ මෙ භික්ඛවේ අන්තා පබ්බජිතෙන න සෙවිතබ්බා, යො චා'යං කාමෙසුකාමසුඛල්ලිකානුයොගො හීනො ගම්මො පොථුජ්ජනිකො අනරියො අනත්ථසංහිතො, යො චා'යං අත්තකිලමථානුයොගො දුක්ඛො අනරියො අනත්ථසංහිතො. එතෙ තෙ උභො අන්තේ අනුපගම්ම මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා.......

සං. නි. v, ධම්මචක්කප්පවත්තනසුත්තං, බු. ජ. මු. නැදිමාල, 2005, පි. 270.

[11] යාවත් ජීවෙත් සුඛං ජීවෙත් - ඍණං කත්වා ඝෘතං පිබෙත්

හස්මීකෘතස්‍ය දෙහස්‍ය - පුනරාගමණං කෘතඃ

අරියවිමල හිමි, කොස්වත්තේ, බුද්ධ ධර්මය, සමයවර්ධන මුද්‍රණාලය, මරදාන, 1996, පි. 81.

[12] සමණො බලු හො ගොතමො සබ්බ කම්මානං අකිරියං පඤ්ඤපෙති. සබ්බකම්මානං බො පන අකිරියං පඤ්ඤපෙන්තො උච්ඡේදං ආහ ලොකස්ස

අං. නි. චතුක්කනිපාත, තතියකම්මසුත්තං, බු. ජ. මු. 2005, පි. 448.

[13] අහඤ්චානන්ද වච්ඡගොත්තස්ස පරිබ්බාජකස්ස අත්ථත්තාති පුට්ඨො සමාණො අත්ථත්තාති ව්‍යාකරෙය්‍යං යෙ තෙ ආනන්ද සමණබ්‍රාහ්මණා සස්සතවාදා තෙසමෙතං ලද්ධි අභවිස්ස. අහං ච ආනන්ද වච්ඡගොත්තස්ස පරිබ්බාජකස්ස නත්ථත්තාති පුට්ඨො සමාණො ව්‍යාකරෙය්‍යං යෙ තෙ ආනන්ද සමණබ්‍රාහ්මණා උච්ඡේදවාදා තෙසමෙතං ලද්ධි අභවිස්ස සං. නි. iv අත්ථත්තසුත්තං, බු. ජ. මු. 2005, පි. 704.

[14] ද්වයනිස්සිතො'යං හො කච්චාන ලොකො යෙභුය්‍යෙන අත්ථිතඤ්චෙව නත්ථිතඤ්ච සබ්බමත්ථී'ති බො කච්චාන අයමෙකො අන්තො. සබ්බං නත්ථී'ති අයං දුතියො අන්තො. එතෙ තෙ කච්චාන උභො අන්තෙ අනුපගම්ම මජ්ඣෙන තථාගතො ධම්මං දෙසෙති. අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං.....

සං. නි. ii, බු. ජ. මු. නැදිමාල, 2005, පි. 28.

[15] රාහුල හිමි, වල්පොල, බුදුන් වදාළ ධර්මය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, කොළඹ, 1195, පි. 79.

[16] ''චත්තාරො මෙ භික්ඛවෙ සඤ්ඤා විපල්ලාසා, චිත්ත විපල්ලාසා, දිට්ඨි විපල්ලාසා, කතමෙ චත්තාරො? අනිච්චේ භික්ඛවෙ නිච්චන්ති, දුක්ඛෙ භික්ඛවෙ සුඛන්ති, අනත්තනි භික්ඛවෙ අත්තාති අසුභෙ භික්ඛවෙ සුභන්ති''

පටිසම්භිදාපකරණං, විපල්ලාසකථා, බු. ජ. මු. නැදිමාල, 2005, පි. 506.

[17] සබ්බෙ සංඛාරා අනිච්චාති - යදා පඤ්ඤාය පස්සති......

සබ්බේ සංඛාරා දුක්ඛාති - යදා පඤ්ඤාය පස්සති......

සබ්බේ ධම්මා අනත්තාති - යදා පඤ්ඤාය පස්සති

අථ නිබ්බින්ධති දුක්ඛෙ - එස මග්ගො විසුද්ධියා

ඛුද්දක නිකාය, ධම්මපදය, මග්ගවග්ග, බු. ජ. මු. නැදිමාල, 2005, ගා. 277-279. පි. 94.

[18] කතමො ච භික්ඛවෙ පටිච්චසමුප්පාදො ජාති පච්චයා භික්ඛවෙ ජරා මරණං උප්පාදා වා තථාගතානං අනුප්පාදා වා තථාගතානං ඨිතාව සා ධාතු ධම්මට්ඨිතතා, ධම්මනියාමතා.......

සං. නි. අභිසමය සංයුත්තං, පච්චයසුත්තං, බු. ජ. මු. පි. 66.

[19] රූපං භික්ඛවෙ අනිච්චං, වෙදනා අනිච්චා, සඤ්ඤා අනිච්චා, සංඛාරා අනිච්චා, විඤ්ඤාණං අනිච්චං, යදනිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තදනත්තා ම. නි. I , චූල්ල සච්චක සුත්තං, බු. ජ. මු. නැදිමාල, 2004, පි. 542.

[20] සං. නි. ii, නඛසිකාසුත්තං, බු. ජ. මු. නැදිමාල, 2005, පි. 406.

[21] තං කිං මඤ්ඤථ භික්ඛවෙ රූපං නිච්චං වා අනිච්චං වාති?, අනිච්චං භන්තෙ, යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති?, දුක්ඛං භන්තෙ, යං පනානිච්චං, දුක්ඛං විපරිණාමධම්මං කල්ලං නු තං සමනුපස්සිතුං එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තාති? නොහෙතං භන්තෙ, පඤ්චවග්ගියසුත්තං, බු. ජ. මු. නැදිමාල, 2005, පි. 116.

[22] රූපං අනත්තං, වෙදනා අනත්තා, සඤ්ඤා අනත්තා, සංඛාරා අනත්තා, විඤ්ඤාණං අනත්තංති

-එම- පි. 116.

[23] රූපං භික්ඛවෙ අනත්තා, රූපඤ්ච හිදං භික්ඛවෙ අත්තා අභවිස්ස. නයිදං රූපං ආබාධාය සංවත්තෙය්‍ය

-එම- පි. 116.

[24] වරං භික්ඛවෙ අස්සුතවා පුථුජ්ජනො ඉමං චාතුම්මහාභූතිකං කායං අත්තනො උපගච්ඡෙය්‍ය. නත්වෙවං චිත්තං

සං. නි. ii, අස්සුතවන්තුසුත්තං, බු. ජ. මු. නැදිමාල, 2005, පි. 148.

[25] ම. නි. අලගද්දූපමසුත්තං, බු. ජ. මු. නැදිමාල, 2005, පි. 340 -342

[26] -එම- පි. 348.

[27] පපඤ්චසූදනී නාම මජ්ඣිමනිකායට්ඨකථා, හේ. වි. මු. 1948, පි. 85.

[28] -එම- පි. 126.

[29] ම. නි. අලගද්දූපමසුත්තං, බු. ජ. මු. නැදිමාල, 2005, පි. 348.

[30] -එම- පි. 350.

සහකාර කථිකාචාර්ය,

රාජකීය පණ්ඩිත වැලිවිට සොරත හිමි,

B.A. (Hons.) M.A. (Kel)

භාෂා අධ්‍යයන අංශය,

බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය,

අනුරාධපුර